# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 02

## ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

1. පහත ප්‍රකාශ සත්‍ය නම් (✓) ලකුණද අසත්‍ය නම් (×) ලකුණද යොදන්න.

   (1) අතීත සිදුවීමක ප්‍රතිඵලයක් මත බිහි වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා එන ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් වත්කමකි. (      )
   (2) මුදලින් මැනිය හැකි මෙන්ම මැනිය නොහැකි සම්පත් වාර්තා කිරීම මූල්‍ය මිනුම් සංකල්පය මඟින් සිදු වේ. (      )
   (3) ව්‍යාපාරයේ අයිතිකරුවන් ව්‍යාපාරයට යොදවන සම්පත් ප්‍රාග්ධනය ලෙස හඳුන්වයි. (      )
   (4) කාලසීමාව අවසානයේ වත්කම්, වගකීම් හා හිමිකම් ඇසුරින් ආදායම් ප්‍රකාශය පිළියෙල කළ හැකිය. (      )

2. පහත හිස්තැන් පුරවන්න.

   (1) අයිතිකරුවන්ගේ දායකත්වයෙන් තොරව හිමිකම ඉහල නැංවීමට හේතු වන ආර්ථික ප්‍රතිලාභයන්ගේ ඉහල යාම .............................................. ලෙස හැඳින්වේ.
   (2) ව්‍යාපාරයට එහි අයිතිකරුවන්ගෙන් හා වෙනත් පාර්ශවයන්ගෙන් වෙන්ව ස්වාධීන පැවැත්මක් ඇති බව ............................................................ සංකල්පය වේ.
   (3) අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් ගන්නා සම්පත් වල මූල්‍යමය වටිනාකම .................................................... නමින් හඳුන්වයි.
   (4) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් මත බිහිවී ඇති, නිරාකරණය කිරීමේදී සම්පත් පිටතට ගලා යන වර්තමාන බැදීම් ................................. ක් වේ.

   (ආදායම්, ව්‍යාපාර ඒකක, ගැනිලි, වගකීම)

3. කෙටි පිළිතුරු සපයන්න.

   (1) වත්කමක් යන්න හඳුන්වන්න.
   (2) ව්‍යාපාරයක වගකීමක් අඩු වී හිමිකම වැඩි වීමට අදාල ගණුදෙණුවක් වටිනාකම සහිතව දක්වන්න.

4. පහත තොරතුරු අමයුරු ව්‍යාපාරයට අදාල වේ.

| | 2021.01.01 | 2022.01.01 |
|---|---|---|
| | රු'000 | රු'000 |
| මුළු වත්කම් | 500 | 800 |
| මුළු වගකීම් | 200 | 400 |

වර්ෂය තුළ අයිතිකරු විසින් රු. 50,000 ක මුදලක් ආයෝජනය කරන ලදි.
2021.12.31 දිනෙන් අවසන් වර්ශය සඳහා ව්‍යාපාරයේ ලාභය කොපමණද ?

5. පහත සඳහන් සමීකරණ වලින් නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,

(1) හිමිකම + වගකීම = වත්කම් + ආදායම්
(2) ආදායම් - වියදම් + හිමිකම = වත්කම් + වගකීම්
(3) හිමිකම + වගකීම = වත්කම් + වගකීම්
(4) හිමිකම - ආදායම + වගකීම = වත්කම් + වියදම්
(5) හිමිකම + ආදායම + වගකීම = වත්කම් + වියදම්

6, 7 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

වනිගරත්න විසින් ලැයිස්තුගත මිල රු.250,000 ක් වූ භාණ්ඩ සිසිරට විකුණන ලද අතර එහි දී 10 % ක වෙළඳ වට්ටමක් ලබා දෙන ලදි. මෙම භාණ්ඩ වල පිරිවැය රු. 140,000 ක් විය. සිසිර විසින් මුදල් ගෙවීමේදී 10%ක වට්ටමක් සහිතව මුදල් ගෙවන ලදී.

6. ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට වන ශුද්ධ බලපෑම වන්නේ,

| | **වත්කම්** | **=** | **හිමිකම්** | **+** | **වගකීම** |
|---|---|---|---|---|---|
| (1) | + 250,000<br>- 250,000 | = | 0 | + | 0 |
| (2) | + 225,000<br>- 250,000 | = | -25,000 | + | 0 |
| (3) | + 62,500 | = | +62500 | + | 0 |
| (4) | - 225,000<br>+ 225,000 | = | 0 | + | 0 |
| (5) | + 250,000<br>- 225,000 | = | 0 | + | 0 |

7. ඉහත සිද්ධීන් අතුරින් වට්ටම් ගිණුම්ගත කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

| | | | | |
|---|---|---|---|---|
| (1) | දුන් වට්ටම් | හර | 25,000 | |
| | වෙළඳ ලැබිය යුතු දෑ | | | 25,000 |
| (2) | වෙළඳ ලැබිය යුතු දෑ | හර | 25,000 | |
| | දුන් වට්ටම් | | | 25,000 |

(3) දුන් වට්ටම් හර 22,500
වෙළඳ ලැබිය යුතු දෑ 22,500

(4) ලද වට්ටම් හර 22,500
වෙළඳ ගෙවිය යුතු දෑ 25,000

(5) වෙළඳ ගෙවිය යුතු දෑ හර 22,500
ලද වට්ටම් 22,500

8. සහශ්‍ර ලංකා සමාගමේ ප්‍රධාන කාර්යාලය මඟින් විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත 2021.10.01 දින රු. 600,000 ක් වටිනා භාණ්ඩ ගෝනපල ශාඛාවට යවන ලදි. යවන ලද තොග විකුණුම් ලෙස සලකා (පිරිවැය රු. 400,000) ගිණුම් ලිපිකරු සටහන් කරන ලදි. 2021.03.31 වන විටඑම තොග වලින් 60 % ක් විකුණා ඇති බව ගෝනපල ශාඛාවේ කළමණාකරු විසින් දන්වා ඇත.

මෙම ගණුදෙණු වලට අදාල ව ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ,

| | වත්කම් | = | හිමිකම (රු'000) | + | වගකීම (රු'000) |
|---|---|---|---|---|---|
| (1) | + 200 | = | + 200 | + | 0 |
| (2) | + 200 | = | + 0 | + | 0 |
| (3) | + 0 | = | + 120 | + | 120 |
| (4) | + 200 | = | + 0 | + | 200 |
| (5) | + 120 | = | + 120 | + | 0 |

9. යම් ව්‍යාපාරයක ගැනිලි හා අමතර ප්‍රාග්ධනයට යොදවා නොමැති විට දී කාලච්ඡේදය සඳහා ව්‍යාපාර ආයතනයට අලාභය පෙන්නුම් කරන අවස්ථාව වන්නේ,

(1) කාලච්ඡේදය අවසානයේදී ශුද්ධ වත්කම් වැඩි වන අවස්ථාව
(2) කාලච්ඡේදය තුල මුළු වත්කම් අඩු වන අවස්ථාව
(3) කාලච්ඡේදය තුල මුළු වගකීම් වැඩි වන අවස්ථාව
(4) කාලච්ඡේදය අවසානයේ දී, කාරක ප්‍රාග්ධනය වැඩි වන අවස්ථාව
(5) ව්‍යාපාරයේ මුළු වගකීම් වලට වඩා මුළු වත්කම් වැඩි වන අවස්ථාව

10. ක්‍රමවත්ව ගිණුම් තැබීමක් සිදු නොකළ අජිත් ව්‍යාපාරයේ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ව්‍යාපාරයේ ලාභය රු.6,000,000 කි. 2020.03.31 දිනට හිමිකම රු. 8,700,000 ක් වූ අතර වර්ෂය තුළ අමතර ප්‍රාග්ධනය රු. 400,000 යොදවා ඇති වර්ෂය තුළ සිදු කළ ගැනිලි රු. 75,000 ක් වේ. 2019.04.01 දිනට ප්‍රාග්ධනය කොපමණද?

(1) රු. 2,375,000
(2) රු. 3,025,000
(3) රු. 8,375,000
(4) රු. 9,025,000
(5) රු. 14,375,000